සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2023 (2024)
க.பொ.த. (சா/த) முன்மாதிரிப் பரீட்சை 2023 (2024)
G.C.E. (O/L) Practice Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 11

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

60 S I

කාලය / நேரம் / Time: පැය 1 යි

## I කොටස

ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමෙන් ප්‍රසිද්ධියට පත් ආයතනයක් වන "හිරුෂ ටුවර්ස්" ආයතනයේ කළක් සේවය කළ වගීෂ, "මුණසිංහ ට්‍රැවල්ස්" නමින් පෞද්ගලික ප්‍රවාහන සේවා සපයන ආයතනයක් ආරම්භ කළේය. අධිවේගී මාර්ග ඉදිවීම, මාර්ග පුළුල් වීම හා ව්‍යාප්තවීම තම ව්‍යාපාරයට පහසුවක් බවත්, සෑම වසරකම දෙවන වාරයේ පාසල් අධ්‍යාපන චාරිකා වෙනුවෙන් බස්රථ සඳහා හොඳ ඉල්ලුමක් පවතින බවද වගීෂ ප්‍රකාශ කළේය.

01) මුණසිංහ ට්‍රැවල්ස් ආයතනයට ඇල්මක් දක්වන සිද්ධියේ සඳහන් පාර්ශවයන් දෙකක් වනුයේ,

i. රජය හා බැංකු
ii. බැංකු හා ප්‍රජාව
iii. පාසල් සිසුන් හා මුණසිංහ ට්‍රැවල්ස්
iv. සේවකයන් හා හිරුෂ ටුවර්ස්

02) සිද්ධියේ සඳහන් මුණසිංහ ට්‍රැවල්ස් ආයතනය විසින් සපුරාලන වුවමනාවක් හා අවශ්‍යතාවයක් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

i. විනෝදය - චාරිකා
ii. චාරිකා - ප්‍රවාහනය
iii. ප්‍රවාහනය - චාරිකා
iv. සෞඛ්‍ය - විනෝදය

03) මුණසිංහ ව්‍යාපාරය සතු ශක්තියක් හා අවස්ථාවක් පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

i. පාසල් අධ්‍යාපන චාරිකා හා වගීෂගේ උනන්දුව හා කැපවීම
ii. වගීෂ "හිරුෂ ටුවර්ස්" ආයතනයේ සේවයකර තිබීම හා අධිවේගී මාර්ග ඉදි වීම
iii. මහා මාර්ග පුළුල් වීම හා අධිවේගී මාර්ග ඉදි වීම
iv. ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම හා ව්‍යාපාරික හැකියාව

04) මුණසිංහ ට්‍රැවල්ස් ආයතනය සතු බස්රථ අයත්වන නිෂ්පාදන සාධකය වන්නේ,

i. භූමිය
ii. ශ්‍රමය
iii. ප්‍රාග්ධනය
iv. ව්‍යවසායකත්වය

05) සීමාසහිත මාතලේ විවිධ සේවා සමූපකාර සමිතිය වගකීම .................... වූ ................. අංශයට අයත් .......................... ව්‍යාපාර සංවිධානයකි.

i. අසීමිත, පෞද්ගලික, ලාභ අරමුණුකර නොගත්
ii. සීමිත, රාජ්‍ය, ලාභ අරමුණුකර නොගත්
iii. සීමිත, පෞද්ගලික, ලාභ අරමුණුකර ගත්
iv. සීමිත, පෞද්ගලික, ලාභ අරමුණුකර නොගත්

06) ෂවින්ද්‍රි ස්ටෝර්ස් ව්‍යාපාරයේ නාමය ලියාපදිංචිය අනිවාර්ය බව එහි අයිතිකරු වන ෂවින්ද්‍රි ඇල්ලෙපොලට උපදෙස් ලැබී ඇත. එයට හේතු වන්නේ,

i. රජයෙන් විවිධ සහන ලබා ගැනීමට සුදුසුකමක් වන නිසාය
ii. ඇයගේ නමට සමාන නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන බැවිනි
iii. ෂවින්ද්‍රිගේ ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලබා ගැනීම අනිවාර්ය නිසාය
iv. ඇයගේ සම්පූර්ණ නාමයෙන් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසාය

07) වානිජ බැංකු විසින් පවත්වාගෙන යන ගිණුම් වර්ගයක ප්‍රයෝජන කීපයක් මෙසේය.

x. මුදල්වලට ආරක්ෂාවක් හිමිවීම.

y. පොළී ආදායමක් හිමිවීම

z. හරපත් මගින් ගණුදෙනු කළ හැකි වීම

ඉහත ලක්ෂණ දැකිය හැකි ගිණුම් වර්ගය වනුයේ,

i. ස්ථාවර තැන්පතු ගිණුමිය

ii. කාලීන තැම්පතු ගිණුමිය

iii. ඉතිරිකිරීමේ ගිණුමිය

iv. ජංගම ගිණුමිය

08) උඩුවාවල සම්පත් බැංකුවේ ජංගම ගිණුමක් හිමි සජිනි, නුවරඑළියේ සෙලාන් බැංකුවේ ජංගම ගිණුමක් පවත්වාගෙන යන මයන්තිගෙන් තම ව්‍යාපාරයට අවශ්‍ය රූපලාවන්‍ය උපකරණ ලබාගෙන ඒ සඳහා චෙක්පත් ලබා දී ඇත. ඉහත සිද්ධියට අදාළ චෙක්පතේ අණකරු, අණලදු හා ආදායකයා අනුපිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,

i. සජිනි, සම්පත් බැංකුව, මයන්ති

ii. සජිනි, සෙලාන් බැංකුව, මයන්ති

iii. මයන්ති, සම්පත් බැංකුව, සජිනි

iv. සෙලාන් බැංකුව, සජිනි, මයන්ති

09) වාණිජ බැංකුවකින් නිකුත්කරනලද චෙක්පතක සමාන්තර රේඛා දෙකක් මැද වාණිජ බැංකුවක නමක් සඳහන් කර තිබුණි. එහි අදහස නම්,

i. එම චෙක්පත අගරු වී ඇති බවයි

ii. එම චෙක්පත පිටසන් කර ඇති බවයි.

iii. එම චෙක්පත රේඛණය කර ඇති බවයි.

iv. එම චෙක්පතට විශේෂ රේඛණයක් යොදා ඇති බවයි.

10) අජිතා මහත්මිය පාසල නිම වී ත්‍රිරෝද රථයකින් ගමන්කරමින් සිටියදී රථය අනතුරකට ලක්ව, ඇය සුළු තුවාල ලැබීය. ත්‍රිරෝද රථයේ හිමිකරු එවලේම තම රථය රක්ෂණය කර තිබූ ABC රක්ෂණ සමාගමට අනතුර පිළිබඳව තම ජංගම දුරකථනයෙන් කෙටි පණිවිඩයක් මගින් දැනුම්දෙන ලදී.

ඉහත සිද්ධියට සම්බන්ධ රක්ෂකයා, රක්ෂිතයා හා තෙවන පක්ෂය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

i. ABC සමාගම, අජිතා මහත්මිය, ත්‍රිරෝද හිමිකරු

ii. අජිතා මහත්මිය, ත්‍රිරෝද හිමිකරු, ABC සමාගම

iii. ABC සමාගම, ත්‍රිරෝද හිමිකරු, අජිතා මහත්මිය

iv. ත්‍රිරෝද හිමිකරු, ABC සමාගම, අජිතා මහත්මිය

11) ඉහත සිද්ධියට අදාළ අනතුර වාර්තා කිරීම සඳහා ත්‍රිරෝද රථ හිමිකරු භාවිතා කළ කෙටි පණිවිඩය අයත්වන සන්නිවේදන මාධ්‍ය වනුයේ,

i. විද්‍යුත් සංඥා

ii. විද්‍යුත් ලිඛිත

iii. සංඥා ලිඛිත

iv. විද්‍යුත් වාචික

12)

| | |
|---|---|
| 1. ඇල්ල ඔඩිසි | A. බලය |
| 2. කළ්‍යාණි පිවිසුම | B. පර්යන්තය |
| 3. ඔළුවිල් | C. මාර්ගය |
| 4. දෙමුහුන් | D. මාධ්‍යය |

ඉහත දී ඇති ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන් සහ එම මූලිකාංග නිවැරදිව ගලපන ලද පිළිතුර වනුයේ,

i. D, B, A, C

ii. D, C, A, B

iii. D, C, B, A

iv. D, B, C, A

13) තැපැල් දෙපාර්තමේන්තුව විදුලි පණිවිඩ සේවාව වෙනුවට හඳුන්වාදුන් නවතම සේවාව.................... සේවාව වන අතර, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව .................... අළුතෙන්ම ධාවනයට එක් කළ සේවාවකි.

i. ඊ මේල් - රේල්බසය

ii. ටෙලිමේල් - රේල්බසය

iii. ටෙලිමේල් - නැරඹුම් මැදිරි

iv. ටෙලිග්‍රෑම් - නැරඹුම් මැදිරි

14) සැළසුම්කරණය සඳහා පාසලක ඇති ක්‍රියාකාරකමක් වනුයේ,

i. සහකාර විදුහල්පතිවරුන් පත් කිරීමයි.

ii. ශිෂ්‍යයන්ගේ තොරතුරු රැස් කිරීමයි.

iii. පංති කාලසටහන පිළියෙල කිරීමයි.

iv. සිසුන්ට ප්‍රගති වාර්තා නිසි වේලාවට ලබා දීමයි

15) අනුෂ්කා මෑතකදී රැකියාවක් ලැබ නිවෙසක් ඉදිකිරීම සඳහා සූදානම් වෙමින් සිටියි. එම නිවෙස ඉදිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය රැස් කිරීම අයත්වන කළමණාකරණ කාර්‍ය්‍ය වනුයේ,

i. පාලනය ii. සැළසුම්කරණය iii. මෙහයවීම iv. සංවිධානකරණය

16) නිශ්චිත ප්‍රතිලාභ අනුපාතයක් රහිත ආයෝජන මාර්ගය කුමක්ද?

i. භාණ්ඩාගාර බිල්පත් ii. ඉතිරිකිරීමේ තැන්පතු
iii. සාමාන්‍ය කොටස් iv. ස්ථාවර තැන්පතු

17) ද්විත්ව සටහන් න්‍යාය ලොවට හඳුන්වා දුන්නේ,

i. ඉතාලි ජාතික ලුවී පාස්චර්ය ii. ඉතාලි ජාතික ප්‍රැට්‍රික් ලුලුම්බාය
iii. ඉතාලි ජාතික ලූකා පැසියෝලිය iv. ඉතාලි ජාතික මොනාලිසාය

18) ව්‍යාපාරයක සිදුවූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් 18 හා 19 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A - අයිතිකරු අමතර ප්‍රාග්ධනය යෙදීම. | රු. 500 000 |
| B - අත්පිට මුදලට භාණ්ඩ ගැනීම. | රු. 20 000 |
| C - විදුල් ගාස්තු ගෙවීම. | රු. 8 000 |
| D - රු. 8000 ක භාණ්ඩ තොගයක් රු 10000 කට විකිණීම. | |

ඉහත A, B, C, D ගණුදෙනු අවසානයේ වත්කම් වල වටිනාකමේ සිදුවූ වෙනස කීයද?

i. රු. 494,000 ii. රු. 510,000
iii. රු. 526,000 iv. රු. 530,000

19) ඉහත ගණුදෙනු අතරින් හිමිකම වෙනස් වීමට බලපාන ගණුදෙනු වන්නේ,

i. A, B හා C ii. A, C හා D
iii. B, C හා D iv. A, B, C හා D යන සියල්ලම

20) ව්‍යාපාරයකට රු. 2,000,000 ක් ගෙවා යන්ත්‍රයක් මිලදී ගැනීම නිසා,

i. වත්කම් වැඩිවේ, වගකීම් වැඩිවේ. ii. වියදම් වැඩිවේ, වත්කම් වැඩිවේ.
iii. හිමිකම් වැඩි වේ, වත්කම් අඩු වේ. iv. වත්කම් වැඩිවේ, වත්කම් අඩු වේ.

21) X තීරුවේ ගිණුම් වර්ගයද Y තීරුවේ එම ගිණුම් සඳහා නිදසුන් කිහිපයක්ද පහත දැක්වේ,

| X | Y |
|---|---|
| 1. හිමිකම් | A. බැංකු ණය පොලී ගිණුම |
| 2. වගකීම් | B. උපචිත වියදම් ගිණුම |
| 3. ආදායම් | C. ගැනිලි ගිණුම |
| 4. වියදම් | D. විකුණුම් ගිණුම |

X තීරුවේ සඳහන් ගිණුම් වර්ග Y තීරුවේ සඳහන් නිදසුන් සමග පිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

i. 1 - C, 2 - A, 3 - B, 4 - D ii. 1 - C, 2 - B, 3 - D, 4 - A
iii. 1 - A, 2 - B, 3 - C, 4 - D iv. 1 - A, 2 - D, 3 - C, 4 - B

22) ව්‍යාපාරයක මූලික පොත්වල සටහන් කර තිබූ ගණුදෙනු දෙකක් පහත දැක්වේ.

| | |
|---|---|
| අත්පිට විකුණුම් | රු. 15,000 |
| ණයහිමියෙකුට ගෙවීම | රු. 14,000 |

ඉහත ගණුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කිරීමේදී භාවිතා කළ මූලාශ්‍ර ලේඛන පිළිවෙලින්,

i. විකුණුම් ඉන්වොයිසිය, ගැනුම් ඉන්වොයිසිය

ii. ලදුපත, ගැනුම් ඉන්වොයිසිය

iii. ලදුපත, ගෙවීම් වවුචරය

iv. ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය

බැංකු ගිණුමක් පවත්වාගෙන යන සජිනිට රු. 15,000 දක්වා අයිරා පහසුකම් ලබා ගැනීමට අවසර ඇත. ඇයගේ බැංකු ගිණුමේ ශේෂය රු. 6000 ක් ව තිබියදී ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු රු. 10,000 කි.

අංක 23 හා 24ට ඉහත සිද්ධිය අදාළ වේ.

23) සජිනි ලබාගෙන ඇති බැංකු අයිරාවේ වටිනාකම වනුයේ,

i. රු. 15,000 ii. රු. 10,000 iii. රු. 6,000 iv. රු. 4,000

24) ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන,

| | | | |
|---|---|---|---|
| i. බැංකු ගිණුම | හර | රු. 10,000 | |
| රක්ෂණ ගාස්තු ගිණුම | බැර | | රු. 10,000 |
| ii. රක්ෂණ ගාස්තු ගිණුම | හර | රු. 6,000 | |
| බැංකු ගිණුම | බැර | | රු. 6,000 |
| iii. රක්ෂණ ගාස්තු ගිණුම | හර | රු. 4,000 | |
| මුදල් ගිණුම | බැර | | රු. 4,000 |
| iv. රක්ෂණ ගාස්තු ගිණුම | හර | රු. 10,000 | |
| බැංකු ගිණුම | බැර | | රු. 10,000 |

25) ව්‍යාපාරයක පැවැති සුළු මුදල් අග්‍රිමය රු. 2500 කි. 2017.03.31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 500 ක් වූ අතර, එදින ප්‍රතිපූර්ණය කළ මුදල රු. 3000 කි. මාර්තු මාසයේ සිට සුළු මුදල අග්‍රිමය කෙපමණ මුදලකින් වැඩිකර තිබේද ?

i. රු. 500 කි. ii. රු. 1000 කි. iii. රු. 2000 කි iv. රු. 2500 කි.

26) මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව දුන් වට්ටම් ගිණුමේ සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන් රීතිය වන්නේ,

i. ආදායම් - වැඩිවීම - හර
ii. වියදම් - වැඩිවීම - හර
iii. ආදායම් - වැඩිවීම - බැර
iv. වියදම් - වැඩිවීම - බැර

27) විකුණුම් ජ'නලය,

i. මූලාශ ලේඛනයකි
ii. ලෙජර් ගිණුමකි
iii. මූලික සටහන් පොතකි
iv. විකුණුම් ගිණුමකි

28) පහත සඳහන් තොරතුරු ඔබට ලබා දී ඇත.

A - රු. 10,000 ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට විකිණීම

B - රු. 20,000 ක් වටිනා යන්ත්‍රයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා සේපාලගෙන් ණයට ගැනීම

C - රු. 6,000 ක් වටිනා භාණ්ඩ තොගයක් ණයට ලබා ගැනීම

D - අයිතිකරු රු. 5000 ක් වටිනා භාණ්ඩ තොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යාම

ඉහත සඳහන් ගණුදෙනු අතරින් පොදු ජර්නලයේ වාර්තා කරන ගනුදෙනු වන්නේ,

i. A, D ii. A, C, D iii. B, C iv. B, D

- **පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්ණ අංක 29 හා 30 ට පිළිතුරු සපයන්න.**

ණයහිමියෙකුගෙන් ලදවට්ටම් රු. 1500 කි. මෙය ලද වට්ටම් හා ණයහිමි ගිණුමට ද හරකර ඇත.

29) මෙම ගණුදෙනුව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම අංක ගණිතමය සමානතාවයට බල නොපායි

ii. අවිනිශ්චිත ගිණුමේ රු. 3000 ක බැර ශේෂයක් පවතී

iii. අවිනිශ්චිත ගිණුමේ රු. 1500 ක හර ශේෂයක් පවතී

iv. ලද වට්ටම් ගිණුම නිවැරදිව සටහන් කර ඇත.

30) ඉහත වරද නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. ණයගැති ගිණුම | හර | රු. 1500 | |
| ලද වට්ටම් ගිණුම | බැර | | රු. 1500 |
| ii. අවිනිශ්චිත ගිණුම | හර | රු. 1500 | |
| ලද වට්ටම් ගිණුම | බැර | | රු. 1500 |
| iii. අවිනිශ්චිත ගිණුම | හර | රු. 3,000 | |
| ලද වට්ටම් ගිණුම | බැර | | රු. 3,000 |
| iv. ණයහිමි ගිණුම | හර | රු. 1500 | |
| ලද වට්ටම් ගිණුම | බැර | | රු. 1500 |

- **පහත තොරතුරු අසුරින් ප්‍රශ්න අංක 31 හා 32 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අයේෂා මල් පෝච්චි නිෂ්පාදනය සඳහා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර 2018 ජනවාරි මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | රු. 80 000 |
| සෘජු වෙනත් වියදම් | රු. 20 000 |
| වක්‍ර වියදම් | රු. 30 000 |

ජනවාරි මාසය තුළ දී මල් පෝච්චි 2000 ක් නිෂ්පාදනය කරන ලදී. නිෂ්පාදනය කරන එක් මල් පෝච්චියක් සඳහා රු. 35 ක මුදලක් සේවක වැටුප් සඳහා ද ගෙවන ලදී.

31) ප්‍රාථමික පිරිවැය වන්නේ,

i. රු. 100,000 කි. ii. රු. 130,000 කි. iii. රු. 170,000 කි. iv. රු. 200,000 කි.

32) මල් පෝච්චි එකක නිෂ්පාදන පිරිවැය වන්නේ,

i. රු. 50 කි. ii. රු. 65 කි. iii. රු. 85 කි. iv. රු. 100 කි.

33) "Super Six" ක්‍රීඩා සමාජයේ මෙම වසර තුළ පහත ගණුදෙනු සිදු වී ඇත.

| | |
|---|---|
| A - ක්‍රීඩා උපකරණ මිලට ගැනීම | රු. 50 000 |
| B - මුදලින් ලද පරිත්‍යාග | රු. 100 000 |
| C - පරණ පත්තර විකුණුම් | රු. 50 000 |
| D - සාමාජික ගාස්තු ලැබීම | රු. 10 000 |

ඉහත අයිතමයන්ගෙන් ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා භාවිතයට ගන්නා අයිතම ඇතුළත් කාණ්ඩය වන්නේ,

i. A, B, C, D ii. B, C, පමණි iii. B හා D පමණි iv. B, C හා D පමණි

34) "Super Six" ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 150 කි. වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි. සාමාජිකයන් 15 දෙනෙකු හැර සියළු දෙනා මෙම වසරේ මුදල් ගෙවා තිබුණි. මෙම වසරට අදාල සාමාජික මුදල වන්නේ,

i. රු. 15,000 කි. ii. රු. 13,500 කි. iii. රු. 1500 කි. iv. රු. 1350 කි.

35) අනුෂ්කා ව්‍යාපාරයේ 2017.01.01 ට මෝටර් රථ පිරිවැයට රු. 100,000 , 2017.01.01 ට සමුච්චිත ක්ෂය රු. 20,000 කි. මෙම මෝටර් රථයේ වාර්ෂික ක්ෂය ප්‍රතිශතය 10% කි. 2017.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ පෙන්විය යුතු පිරිවැය හා ධාරණ අගය වන්නේ,

i. රු. 100,000 - රු. 80,000 කි. ii. රු. 100,000 - රු. 90,000 කි.

iii. රු. 100,000 - රු. 70,000 කි. iv. රු. 70,000 - රු. 100,000 කි.

36) චම්පිකා ස්ටෝර්ස් හි 2017 වසරේ මුළු විකුණුම් වටිනාකම රු. 100,000 කි. ඉන් 60% ක් ණයට විකුණුම් වේ. ණයට විකුණුම් වලින් 50% ක් මුදල් ව්‍යාපාරයට ලැබී තිබුණි. ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් බොල් ණය ලෙස කපා හරින ලදී. ණයගැති ගිණුමේ ශේෂය සහ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්වෙන බොල්ණය වන්නේ,

i. රු. 30,000 - රු. 3,000 කි. ii. රු. 6,000 - රු. 6,000 කි.

iii. රු. 27,000 - රු. 3,000 කි. iv. රු. 54,000 - රු. 6,000 කි.

• පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන ප්‍රශ්න 37 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

නාලිකා ව්‍යාපාරයේ ආධුනික ගිණුම් ලිපිකරුවෙකු විසින් 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ වෙළඳ හා ලාභ අලාභ ගිණුම පහත දැක්වේ.

වෙළඳ හා ලාභලාභ ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| ආරම්භක තොගය | | 10 000 | විකුණුම් | | 63 000 |
| (+) ගැනුම් | 35 000 | | | | |
| (-) අවසාන තොගය | (3 000) | 32 000 | | | |
| විකුණුම් පිරිවැය | | 42 000 | | | |
| දළ ලාභය (ප / ගෙ) | | 21 000 | | | |
| | | 63 000 | | | 63 000 |
| බෙදාහැරීමේ වියදම් | | | දළ ලාභය ඉ / ගෙ | | 21 000 |
| බොල් ණය | 500 | | (+) ලද වට්ටම් | 2000 | |
| වේතන | 1 500 | | ආයෝජන ආදායම් | 3000 | 5 000 |
| මෝටර් රථ ක්ෂය | 10 000 | | | | |
| පැටවුම් කුලී | 500 | | | | |
| ගෙනඒමේ කුලී | 800 | 13 300 | | | |
| පරිපාලන වියදම් | | | | | |
| අළුත්වැඩියා වියදම් | 800 | | | | |
| රක්ෂණ ගාස්තු | 500 | 1 300 | | | |
| මූල්‍ය හා වෙනත් | | | | | |
| බැංකු ණය පොලී | 500 | 500 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා. | | 10 900 | | | |
| | | 26 000 | | | 26 000 |

37) නාලිකා ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ නිවැරදි විකුණුම් පිරිවැය වන්නේ,

i. රු. 42,000 කි. ii. රු. 43,300 කි. iii. රු. 42,800 කි. iv. රු. 42,500 කි.

38) බෙදාහැරීමේ වියදම් සහ පරිපාලන වියදම් වල නිවැරදි අගයන් පිළිවෙලින් දැක්වෙන්නේ,

i. රු. 2,800 - රු. 10,500
ii. රු. 3,300 - රු. 10,500
iii. රු. 10,500 - රු. 2,800
iv. රු. 10,500 - රු. 3,300

39) මෙම ව්‍යාපාරයේ නිවැරදි දළ ලාභය සහ වෙනත් ආදායම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. රු. 21,000 - රු. 5,000
ii. රු. 20,500 - රු. 5,000
iii. රු. 19,700 - රු. 5,000
iv. රු. 20,200 - රු. 5,000

40) මෙම ව්‍යාපාරයේ වර්ෂය තුළ ගෙවූ බැංකු ණය පොලිය රු. 300 ක් ද, ලද ආයෝජන ආදායම රු. 1800 ක් ද නම් උපචිත ආදායම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. රු. 500 - රු. 3,000 කි.
ii. රු. 300 - රු. 1,200 කි.
iii. රු. 200 - රු. 3,000 කි.
iv. රු. 200 - රු. 1,200 කි.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2023 (2024)
க.பொ.த. (சா/த) முன்மாதிரிப் பரீட்சை 2023 (2024)
G.C.E. (O/L) Practice Test - 2023 (2024)

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 60 S | II |
| කාලය / நேரம் / Time | පැය 2 යි | | | |

II වන පත්‍රය

- පළමු ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01) පහත සඳහන් සිද්ධිය ඇසුරින් ප්‍රශ්න i සිට iv දක්වා පිළිතුරු සපයන්න.

ව්‍යාපාරිකයෙකු වන සේතුංග මහතා "සේතුංග පොත්හල" නමින් පාසල් පොත් හා ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ප්‍රධාන පෙළේ පාසලක් ආසන්නයේ පවත්වාගෙන යනු ලබන මෙම ව්‍යාපාරයේ පාසල් ලිපි ද්‍රව්‍ය සඳහා පාසල් ප්‍රජාවෙන් විශාල ඉල්ලුමක් පවතී. සැලසුමකට අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය තොග වශයෙන් මිලට ගෙන, සාධාරණ මිලට පාරිභෝගිකයන් වෙත අලෙවි කර ඉහළ කීර්තිනාමයක් ලබාගෙන සිටින අතර, සේවකයින් දෙදෙනෙකු බඳවා ගැනීමට ද සේතුංග මහතා තීරණය කරන ලදී.

i. (අ) මෙහි සඳහන් නිෂ්පාදිත දෙකක් නම් කරන්න.
(ආ) මෙම නිෂ්පාදිත කුමන මූලික අවශ්‍යතාවයක් ඉටු කරනු ලබන්නේද?

ii. (අ) ඉහත සිද්ධියේ සඳහන් වන ව්‍යාපාර සංවිධාන වර්ග දෙක නම් කරන්න
(ආ) තොග වෙළඳාමේ ලක්ෂණයක් ලියන්න

iii. (අ) සේතුංග ව්‍යාපාරයේ දැකිය හැකි ව්‍යාපාරික අවස්ථාව කුමක්ද?
(ආ) මෙම ව්‍යාපාරයට අරමුදල් සම්පාදනය කරගත හැකි මාර්ග දෙකක් ලියන්න.

iv. (අ) ව්‍යාපාරයක් නිෂ්පාදිත අලෙවිය වැඩිකර ගැනීම සඳහා නොයෙකුත් උපක්‍රම භාවිතා කරයි. එවැනි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.
(ආ) සේවකයින් බඳවාගැනීමට තීරණය කිරීම කවර කළමණාකරණ කාර්යයකට අයත් ද?

- පහත තොරතුරු උපයෝගී කරගෙන v සිට x දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

2022.01.01 දින සේතුංග මහත්මිය ද, සේතුංග මහතාගේ පොත් සාප්පුව අසලින් දේශීය ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භකරන ලදී. එදින ඇය සතුව තිබූ රු. 100,000 ක ස්ථාවර තැන්පතු මුදලද රු. 20,000 වටිනා ශීතකරණයද ව්‍යාපාරයට යෙදවීය. එදිනට රු. 25,000 ක ලී බඩු ද ණයට ගන්නා ලදී. මෙම ව්‍යාපාරය සඳහා ආහාර සැකසීමට මනා පළපුරුද්දක් ඇති සේවකයෙකු ද බඳවා ගන්නා ලදී.

| 2022 පළමු සතිය තුළ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ. | රු. |
|---|---|
| 2022.01.02 ණයට ගැණුම් (ආහාර ද්‍රව්‍ය) | 500 |
| 01.02 අත්පිට ගැණුම් | 400 |
| 01.03 අත්පිට විකුණුම් | 250 |
| 01.04 ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා උපකරණ මිලට ගැණුම් | 15 000 |

| | |
|---|---|
| 01.04 කඩකුලී ගෙවීම් | 2 000 |
| 01.05 ණයට විකුණුම් | 2 000 |
| 01.06 අයිතිකරුගේ ගැනිලි | 1 000 |
| 01.07 සේවක වැටුප් ගෙව්වා | 5 000 |

v. 2022.01.01 දිනට මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.

vi. (අ) ලී බඩු ණයට ගැනීමට අදාල ද්විත්ව සටහන අගයන් සහිතව ලියා දක්වන්න.

(ආ) එම ගනුදෙනුව සටහන් කිරීමේදී අදාළ කරගන්නා මූලික පොත හා මූලාශ ලියවිල්ල කුමක්ද?

vii. (අ) මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් වල වටිනාකම කොපමණද?

(ආ) 2022.01.07 දිනට අදාළ මුළු වගකීම් වල වටිනාකම කොපමණද?

viii. වියදම් හැරුණුවිට මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම අඩු වීමට තුඩුදුන් ගණුදෙනුවක් ලියා දක්වන්න.

ix. මෙම ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීමට උපයෝගී කරගන්නා මූලික පොත් දෙකක් හා ඒවාට අදාළ මූලාශ ලේඛන ලියා දක්වන්න.

x. 2022.01.07 දිනට සේතුංග මහත්මියගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණද?

(ලකුණු - 2 x 10 = 20)

## I කොටස

- **ප්‍රශ්ණ දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

02) මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප වුවමනා ලෙස හැඳින්වේ.

i. (අ) ව්‍යාපාරයක් යනුවෙන් කුමක් අදහස් වේ ද?

(ආ) ව්‍යාපාර වල පොදුවේ දැකිය හැකි අරමුණු දෙකක් සඳහන් කරන්න.

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයකට ඇල්මැති පාර්ශව දක්වන උනන්දුව එහි අභිවෘද්ධියට හානිකරය.

(ආ) ව්‍යාපාරයක් සාර්ථක වීමට ව්‍යාපාර පරිසරය පිළිබඳ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතුය.

(ඉ) එකම පාරිභෝගික වුවමනා සපුරා ගැනීම සඳහා වුවද, ව්‍යාපාර විසින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කෙරේ.

(ඊ) මිනිසා විසින් සකස්කරන ලද නිෂ්පාදනයේ දී ආධාර කරගන්නා දෑ ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

iii. (අ) ඇල්මැති පාර්ශවයක් ලෙස ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ අරමුණු දෙකක් ලියා දක්වන්න.

(ආ) සේවකයන් විසින් ව්‍යාපාරයට ලබාදෙන දායකත්වය සඳහා නිදසුන් දෙකක් ලියන්න

iv. හිමිකාරීත්වය හා අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ගකර දක්වන්න. (ල. 8)

03) මැදපෙරදිග රටවලට තේ අපනයනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන විල්අමුණ රු. 2,000,000 ක් වටිනා ඔහුගේ ලොරි රථය එම වටිනාකමට ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ රක්ෂණය කර ඇත. තේ ප්‍රවාහනය කරමින් සිටියදී මෙම රථය හදිසි අනතුරකට භාජනය විය. විල්අමුණ විසින් මේ බව රක්ෂණ සමාගමට දැනුම් දීමෙන් අනතුරුව වන්දි වශයෙන් රු. 500,000 ක මුදලක් දීමට එකඟ විය.

i. (අ) ඉහත සිද්ධියට අදාල වන රක්ෂණ මූලධර්මය කුමක්ද?

(ආ) විදේශ වෙළඳාමේ නිරත විල්අමුණට ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග දෙකක් සඳහන් කරන්න.

ii. (අ) තේ අපනයනය සඳහා සුදුසු යැයි ඔබ යෝජනා කරන ප්‍රවාහන මාර්ගය හා ඊට අදාළ මාධ්‍යය නම් කරන්න.

(ආ) මැදපෙරදිග රටවල් සමඟ ගණුදෙනු කිරීමේදී තොරතුරු හුවමාරු කර ගැනීමට යොදා ගත හැකි සන්නිවේදන මාධ්‍යයන් 02 ක් ලියන්න

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(ආ) ස්ථාවර තැන්පතුව ඇපයට තබා තැන්පතුවෙන් යම් ප්‍රතිශතයක් ණය මුදලක් ලෙස ලබාගත හැක

(ආ) ස්කයිප් (Skype) මගින් තොරතුරු සන්නිවේදනය කිරීම, විද්‍යුත් / වාචික / ලිඛිත යන ස්වරූප 3 ට අදාළ වේ

(ඉ) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු අවම හා උපරිම සාමාජික සංඛ්‍යාව හවුල් අඥා පනතට අනුව තීරණය වේ.

(ඊ) ණයපතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් තිබීම අවශ්‍ය වේ.

iv. වර්තමානයේ ජංගම දුරකථන හා අන්තර්ජාලය භාවිතා කරමින් ව්‍යාපාර කටයුතු වල යෙදීම බහුලව දක්නට ලැබේ.

(අ) ජංගම දුරකථන බැංකු ක්‍රමයේ වාසි දෙකක් ලියන්න.

(ආ) පරිගණක ආශ්‍රිතව සිදුවන ගිණුම්කරණයේ අවාසි දෙකක් ලියන්න. (ල. 8)

04) i. (අ) භාණ්ඩාගාර බිල්පතක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ආ) ආයෝජකයෙකුට සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ 2 ක් සඳහන් කරන්න.

ii. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ආයෝජනයක අවදානම ඉහළ යන විට ඉන් ලැබෙන ප්‍රතිලාභය ඉහළ යයි.

(ආ) සැළසුම් කරන ලද ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපාරයේ මානව සම්පත් නිසිලෙස හැසිරවීමේ ක්‍රියාවලිය පාලනය නමින් හඳුන්වයි.

(ඉ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ශනීය ලෙස මෙන්ම ලාභදායී ලෙස තෘප්තිමත් කළ හැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළඳපොළ වේ.

(ඊ) ව්‍යාපාරයේ සම්පත් අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීම කාර්යක්ෂමතාවය වේ.

iii. හර්ෂණි තම ප්‍රදේශයේ රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යයි. ඇයගේ පාසලේ යෙහෙළියන් තිදෙනෙකු ද සේවය කරයි. රූපලාවන්‍යාගාරය වායු සමනය ( AC ) කිරීමට ඇය අදහස් කරගෙන සිටී.

(අ) මෙම ව්‍යාපාරයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා 2ක් සඳහන් කරන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ දැනට සේවය කරන නාලිකා හවුල්කාරිනියක් ලෙස ව්‍යාපාරයට සම්බන්ධ වීමට අදහස් කරගෙන ඇත. එහි දී රු. 850,000 ක ණය මුදලක් ද යෙදවීමට ඇය තීරණය කර ඇත. මේ නිසා ව්‍යාපාරයට අයත්වන නව මූල්‍ය සම්පාදන ක්‍රම 2 ක් දක්වන්න.

iv. (අ) නිශාන්ත පිළිගත් ව්‍යාපාරයක අලෙවි කළමණාකරුවෙකු ලෙස සේවය කරයි. ඔහු විසින් ඉටු කරන ලද කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - නිෂ්පාදිතයන් බෙදා හැරීම සඳහා ශීතාගාර පහසුකම් ඇති වෑන් රථයක් මිළදී ගැනීම

B - දැනට නිපදවන නිපැයුම් වල හැඩය හා සංයෝග වල වෙනස්කම් කිරීමට තීරණය කිරීම

C - පාරිභෝගිකයන් සමග අකර්ශනීය ලෙස සබඳතා පවත්වා ගැනීමට විකුණුම් සේවකයන්ට උපදෙස් ලබා දීම

D - ණය කොන්දේසි හා ගෙවීම් ක්‍රම සරලකොට ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කළ විකුණුම් ආදායම් උපයා ඇත්දැයි සොයා බැලීම.

ඉහත එක් එක් කාර්යය අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත්දැයි සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයකට අලෙවිකරණය වැදගත් වීමට හේතුවන කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 8)

## II කොටස

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න

05) i. (අ) වගකීමක් යනු කුමක්ද?

(ආ) වත්කම් ගිණුම් වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මය ලියන්න.

ii. පහත ගණුදෙනු වලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.

(අ) ණයහිමි විකුම් ට රු. 18,000 ක් චෙක් පතකින් ගෙවීම.

(ආ) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදලින් රු. 15,000 ක් ගැනීම.

iii. චාමික ජංගම දුරකථන සහ උපාංග අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2023.01.01 දින ආරම්භ කරන ලදී. සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. චාමික ව්‍යාපාරයට මුදල් යෙදවීම රු. 200,000

2. බැංකු ණයක් ලබා ගැනීම රු. 100,000

3. කාර්යාල උපකරණ මිලට ගැනීම රු. 60,000

4. ගොඩනැගිල්ලට මාසික කුලිය ගෙවීම රු. 10,000

5. රු. 150,000 ක් වටිනා ජංගම දුරකථනයක් ණයට ගැනීම

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. පළමු ගනුදෙනුව සටහන් කර ඇත.) (පිළිතුරු සැපයීමේදී පහත ආකෘතියක් භාවිතා කරන්න.

| ගනුදෙනුව | වත්කම් (රු) = | හිමිකම් (රු) + | වගකීම් |
|---|---|---|---|
| 1. | +200,000 (මුදල්) | +200,000 (ප්‍රාග්ධනය) | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

(ආ) 2023/01/01 දිනට චාමිකගේ ව්‍යාපාරයේ පහත සඳහන් අයිතම වල වටිනාකම දක්වන්න

1. ජංගම නොවන වත්කම්
2. ජංගම වගකීම්
3. හිමිකම්
4. මුළු වගකීම්

iv. සිතුමි සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

2023/01/10 - එකක් රු. 400 බැගින් තේ කොළ පැකට් 10 ක් නිශාන්තගෙන් ණයට ගැනීම. (ඉන්වොයිස් අංක 510)

2023/01/15 - එකක් රු. 85 බැගින් සීනි පැකට් 100 ක් අත්පිට මුදලට ගැනීම (වවුචර් අංක 55)

2023/01/18 - එකක් රු. 60 බැගින් සබන් කුඩු පැකට් 100 ක් අසංකගෙන් ණයට ගැනීම (ඉන්වොයිස් අංක 420)

2023/01/25 - පසිඳු ලී බඩු වෙතින් රු. 30,000 ක් වටිනා කාර්යාල මේසයක් ණයට ගැනීම (වවුචර් අංක 225)

අවශ්‍ය වන්නේ,

(අ) 2023 ජනවාරි මාසය සඳහා සිතුමිගේ ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම.

(ආ) 2023/01/31 දිනට ගැනුම් ජ'නලයේ තොරතුරු ලෙජර් ගිණුම් වලට පිටපත් කිරීම.

(ල. 12)

06) i. (අ) බැංකු අයිරාවක් යනු කුමක්ද?

(ආ) ගිණුම්කරණයේ දී වැරදි සිදුවන අවස්ථා 02 ක් ලියන්න.

ii. මල් පෝච්චි නිෂ්පාදනය කරන SK ව්‍යාපාරයේ 2023 මාර්තු මාසයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- මල් පෝච්චියක පිරිවැය රු.40
- නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය රු. 30,000
- මුළු නිෂ්පාදන පිරිවැය රු. 80,000
- සෘජු ශ්‍රම පිරිවැය රු. 12,000
- සෘජු වෙනත් වියදම් රු. 8,000

අවශ්‍ය වන්නේ,

(අ) මාර්තු මාසය තුළ නිපද වූ මල් පෝච්චි ගණන.

(ආ) මාර්තු මාසය සඳහා වූ සෘජු පිරිවැය

iii. ෂවින්දි ව්‍යාපාරයේ 2023/06/30 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 28,000 ක් විය. නමුත් 2023 ජුනි මාසය සඳහා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් විය. වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී

- බැංකු ගිණුමේ සටහන් නොවූ සෘජු ප්‍රේෂණ රු. 3000
- තැන්පත් කළ නමුත් නිෂ්කාෂණය නොවූ චෙක්පත් රු. 4000
- නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු. 3800
- බැංකුවට කරන ලද ස්ථාවර නියෝග අනුව ගෙවීම රු. 2500

අවශ්‍ය වන්නේ,

(අ) 2023/06/30 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2023/06/30 දිනට බැංකු සැසඳුමේ විස්තරය පිළියෙල කිරීම.

iv. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේදී සිදු වූ වැරදි කිහිපයකි.

A - රු. 5000 ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත් වලින් සම්පූර්ණයෙන්ම මග හැරීම.

B - ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා මිලට ගත් රු. 20,000 ක් වූ කාර්යාල උපකරණ වල වටිනාකම ගැණුම් ගිණුමට හර කර තිබීම

C - ණයගැතියෙකුගෙන් ලැබුණු රු. 8000 මුදල් පොතේ පමණක් සටහන් කිරීම.

D - විකුණුම් ජ'නලයේත් නිවැරදි එකතුව වූ රු. 35,000 ක් විකුණුම් ගිණුමේ රු. 5000 ක් ලෙස සටහන් කිරීම.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් (ල. 12)

07) i. (අ) ඒක පුද්ගල ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මොනවාද?

(ආ) බොල් ණය ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

ii. ලකී ක්‍රීඩා සමාජයේ 2022 වර්ෂයේ සිටි සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු.150 කි 2022 වර්ෂය සඳහා පිළියෙල කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ලැබීම් හා ගෙවීම් ගිණුම.

| | | | |
|---|---|---|---|
| 22/01/01 ශේෂය | 18 000 | ක්‍රීඩා උපකරණ වියදම් | 9 000 |
| සමාජික මුදල් | 10 000 | ක්‍රීඩා උපදේශක ගාස්තු | 6 000 |
| | | ක්‍රීඩාගාර නඩත්තු වියදම් | 3 000 |
| | | විදුලි ගාස්තු | 2 000 |
| | | 22/12/31 ශේෂය ප/ගෙ | 8 000 |
| | 28 000 | | 28 000 |

අවශ්‍ය වන්නේ,

(අ) 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලකී ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

iii. මානෙල් රණවීරගේ ව්‍යාපාරයේ 2022/12/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 500,000 | |
| ප්‍රාග්ධනය | | 600,000 |
| යන්ත්‍ර - පිරිවැයට | 150,000 | |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම ( 2022/01/01 දිනට) | | 15,000 |
| තොගය (2022/01/01) | 25,000 | |
| ගැනුම් | 250,000 | |
| විකුණුම් | | 340,000 |
| වේතන | 10,000 | |
| ණයගැතියෝ | 20,000 | |
| ණයහිමියෝ | | 25,000 |
| ලද වට්ටම් | | 5,000 |
| දුන් වට්ටම් | 2,000 | |
| විදුලි ගාස්තු | 2,800 | |
| වරිපනම් | 1,200 | |
| ප්‍රචාරණ ගාස්තු | 6,000 | |
| මුදල් ශේෂය | 8,000 | |
| බැංකු ශේෂය | 10,000 | |
| | 985,000 | 985,000 |

අතිරේක තොරතුරු,

1. 2022/12/31 දිනට තොගය රු. 18,000
2. යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.
3. 2022/12/31 දිනට ගෙවිය යුතු විදුලි ගාස්තු රු. 1000

අවශ්‍ය වන්නේ,

(අ) 2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය.

(ආ) 2022/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

# මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மத்திய மாகாண கல்வித் திணைக்களம்
# DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade - 10 ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1) | - | 4 | 11) | - | 1 | 21) | - | 2 | 31) | - | 2 |
| 2) | - | 2 | 12) | - | 2 | 22) | - | 3 | 32) | - | 1 |
| 3) | - | 2 | 13) | - | 3 | 23) | - | 3 | 33) | - | 3 |
| 4) | - | 4 | 14) | - | 4 | 24) | - | 2 | 34) | - | 1 |
| 5) | - | 4 | 15) | - | 1 | 25) | - | 2 | 35) | - | 2 |
| 6) | - | 2 | 16) | - | 2 | 26) | - | 4 | 36) | - | 4 |
| 7) | - | 3 | 17) | - | 3 | 27) | - | 1 | 37) | - | 1 |
| 8) | - | 1 | 18) | - | 2 | 28) | - | 4 | 38) | - | 3 |
| 9) | - | 3 | 19) | - | 4 | 29) | - | 3 | 39) | - | 4 |
| 10) | - | 1 | 20) | - | 3 | 30) | - | 1 | 40) | - | 2 |

(40 x 1 = ලකුණු 40)

### II කොටස

01. i. (අ) පෞද්ගලික අංශයට
(ආ) ලාභ ලැබීමේ අරමුණ (ලකුණු 02)

ii. <u>වාසි</u>
ආරම්භ කිරීම පහසුයි
ලියාපදිංචිය අනිවාර්ය නොවේ. (ලකුණු 02)

<u>අවාසි</u>
නීතිමය පුද්ගල හිමි නොවේ.
වගකීම අසීමිතයි. (ලකුණු 02)

iii. උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාවෙන් අධ්‍යාපනය හැද ෑරීම තමා ඉතිරිකර ගත් මුදල (ලකුණු 02)

iv. ඔව්. අයිතිකරුගේ සම්පූර්ණ නමින් තොරව පවත්වාගෙන යන නිසා (ලකුණු 02)

v.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1/1 | + 250 000 | = | + 250 000 | + | — |
| 1/2 | + 400 000 | = | + 400 000 | + | — |
| 1/3 | + 80 000 | = | — | | + 80 000 |
| | 730 000 | | 650 000 | | 80 000 |

(ලකුණු 02)

21/01/14 අත ඉතිරි මුදල රුː 304 000 (ලකුණු 02)

vi. මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 250 000 | යන්ත්‍ර | 30 000 |
| බැ/ණය | 80 000 | කෙසෙල් කොළ | 5 000 |
| විකුණුම්7 | 5 000 | ජංගම ගිණුම | 50 000 |
| | | විදුලිය | 3 400 |
| | | බැංකු | 2 600 |
| | | ප/ගෙ | 304 000 |
| | 405 000 | | 405 000 |
| ප/ගෙ | 304 000 | | |

vii. බැංකු ණය

| | | | |
|---|---|---|---|
| බැංකු | 4 000 | මුදල් | 80 000 |
| ප/ගෙ | 76 000 | | |
| | 80 000 | | 80 000 |
| | | ඉ/ගෙ | 76 000 |

(ලකුණු 02)

viii. වගකීම ⟶ බැංකු ණය

වත්කම ⟶ යන්ත්‍ර
පදම් කළ කෙසෙල් කොළ
බැංකු ශේෂය
මුදල් ශේෂය

(ලකුණු 02)

ix. 21/1/14 දිනට බැංකු ගිණුම

| | | | |
|---|---|---|---|
| 1/10 මුදල් | 50 000 | කෙ/කොළ | 10 800 |
| මුදල් | 2 600 | ණය වාරික | 4 000 |
| | | ප/ගෙ | 37 800 |
| | 52 600 | | 52 600 |
| ඉ/ගෙ | 37 800 | | |

(ලකුණු 02)

x. බැංකු ගිණුම හර
මුදල් ගිණුම බැර

(ලකුණු 02)

(10 x 02 = ලකුණු 20)

## I කොටස

02.i. අ. ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු දෑ වේ.

ආ. අසීමිත වේ.
නිර්මාණය කළ හැක.
විවිධ වේ.

ii. අ. ✓
ආ. ✗
ඉ. ✓
ඊ. ✓

iii. අ. අවස්ථාව - ජනප්‍රිය පාසලක් අසල තිබීම
තර්ජනය - වෙළඳසැල ආසන්නයේ තවත් පොත් වෙළඳසැලක් ආරම්භ කිරීම.

iv. අ. භූමිය
ප්‍රාග්ධනය
ශ්‍රමය

ආ. භූමිය - දූව
ප්‍රාග්ධනය - ගොඩනැල්ල / යන්ත්‍ර
ශ්‍රමය - අමර
ව්‍යවසාය - සුරේෂ්

03. i. අ. ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දී ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වන
ආ. දැඩි තරඟකාරීත්වයකට මුහුණ දීමට සිදුවීම
දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම
දේශීය ව්‍යාපාරවල පැවැත්ම අස්ථාවර වීම

ii. අ. ✗
ආ. ✓
ඉ. ✓
ඊ. ✗

iii. අ. විදුහල්පතිතුමා
සිසුන්
ගුරුවරුන්
ආ. විදුහල්පතිතුමා - ආපනශාලාවෙන් ලැබිය යුතු ආදායම් පාසලට නිසි පරිදි ලැබේද?
ආහාර ලබා දීමේ ගුණාත්මක බව

සිසුන් - ඕනෑම අවස්ථාවක ආහාර ගත හැකි ද?
ආහාර පාන ගුණාත්මක ද?

ගුරුවරුන් - ආහාර පාන ගුණාත්මක ද?
ඕනෑම අවස්ථාවක ආහාර ලබාගත හැකි ද?

iv. අ. තාක්ෂණික පරිසරය
ආ. • අතීතයේ භාවිතා කළ සාමාන්‍ය තැපැල වෙනුවට දුරකථනය, විද්‍යුත් තැපැල භාවිතය
• අතීතයේ පොත්පත්වල තැබූ ගිණුම් සටහන් වර්තමානයේදී පරිගණක ගත තොරතුරු පද්ධති භාවිතයෙන් සිදු කිරීම.
• අතීතයේ මිනිස්ශ්‍රමය වෙනුවට වර්තමානයේ පරිගණක ගත කළ යන්ත්‍ර සූත්‍ර භාවිතය

04. i. අ. අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් ඒකරාශි වීමයි.
ආ. ව්‍යාපාර සංවිධාන
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
මහා පරිමාණ ව්‍යාපාර

ii. අ. ✗
ආ. ✓
ඉ. ✓
ඊ. ✓

iii. අ. හවුල් ව්‍යාපාර
ආ. 2007 අංක 07 සමාගම් පනත

iv. අ. • ව්‍යාපාරයකට අනන්‍යතාවයක් ලැබේ.
• ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වේ.
• රජයෙන් ලබා දෙන දිරිගැන්වීම් ලබාගත හැක.
ආ. i. රාජ්‍ය සංස්ථා
ii. හවුල් ව්‍යාපාර

05. අ.

මුදල් පොත

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 25 000 | ලී රාක්ක | 5 500 |
| විකුණුම් | 7 500 | ගැණුම් | 12 000 |
| බැංකු ණය | 10 000 | ගෙන ඒමේ කුලී | 750 |
| | | වැටුප් | 1 000 |
| | | ගැනිලි | 5 000 |
| | | ප/ගෙ ශේෂය | 18 250 |
| | 42 500 | | 42 500 |
| ඉ/ගෙ ශේෂය | 18 250 | | |

ප්‍රාග්ධන ගිණුම

| | | | |
|---|---|---|---|
| | | මුදල් | 25 000 |

ලී රාක්ක

| | | | |
|---|---|---|---|
| | | මුදල් | 5 500 |

ගැණුම්

| | | | |
|---|---|---|---|
| මුදල් | 12 000 | | |

ගෙන ඒමේ කුලී

| | | | |
|---|---|---|---|
| මුදල් | 750 | | |

විකුණුම්

| | | | |
|---|---|---|---|
| | | මුදල් | 7 500 |

බැංකු ණය

| | | | |
|---|---|---|---|
| | | මුදල් | 10 000 |

වැටුප්

| | | | |
|---|---|---|---|
| මුදල් | 1 000 | | |

ගැනිලි

| | | | |
|---|---|---|---|
| මුදල් | 5 000 | | |

ආ. විකිණීම සඳහා මයුරගෙන් ලබා ගත් රුː 10 000 ක බඩු තොගය පිළිබඳ කිසිදු සටහනක් නොමැතිවීම ගෙවූ බැංකු ණය පොලී රුː 1,500 මුදල් පොතේ නිවැරදිව සටහන් කර, බැංකු ණය ගිණුමට හර කර තිබීම.

**ජ'නල් සටහන්ː**

| | | |
|---|---|---|
| ගැනුම් ගිණුම හර | 10 000 | |
| මයුරගේ ගිණුම | | 10 000 |

(මයුරගෙන් ගත් භාණ්ඩ සටහන් කිරීම)

| | | |
|---|---|---|
| ගෙවූ ණය පොලි ගිණුම හර | 1 500 | |
| බැංකු ණය ගිණුම | | 1 500 |

(ගෙවූ ණය පොලී නිවැරදි කිරීම)

ii. අවිනිශ්චිත ගිණුම

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 5 000 | වෙනස | 2 500 |
| | | රක්ෂණය | 2 500 |
| | 5 000 | | 5 000 |

06. අ. i. ව්‍යාපාරයක සුළු වියදම් සඳහා ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබාදෙන නිශ්චිත මුදලයි.

ii. සුළු මුදල් භාරකරු විසින් වියදම් කල මුදලට සමාන මුදලක් නැවතත් ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලබා ගැනීම අග්‍රීමය ප්‍රතිපූර්ණයයි.

සුළු මුදල් පොත

iii.

| ලැබීම් රුː | ස/පි | දිනය | විස්තරය | ච/අ | ගෙවීම් රුː | විශ්ලේෂණ තීරු | | | ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගමන් | සංග්‍ර | ලිපිද්‍රව්‍ය | |
| 150 | | 1/31 | ශේෂය ඉ/ගෙ | | | | | | |
| 1850 | | 2/1 | මුදල් | | | | | | |
| | | 2/2 | ගමන් ගාස්තු | 01 | 80 | 80 | | | |
| | | 2/3 | වැටුප් අත්තිː | 02 | 200 | | | | 200 |
| | | 2/10 | පෑන් පැන්සල් | 03 | 100 | | | 100 | |
| | | 2/12 | සීනි, තේකොළ | 04 | 120 | | 120 | | |
| | | 2/15 | බස් ගාස්තු | 05 | 100 | 100 | | | |
| | | 2/17 | සී. ආර්. පොත් | 06 | 160 | | | 160 | |
| | | 2/20 | සිසිල් බීම | 07 | 100 | | 100 | | |
| | | | | | 860 | 180 | 220 | 260 | 200 |
| | | 2/28 | | | 1140 | | | | |
| 2000 | | | | | 2000 | | | | |
| 1140 | | 3/11 | ඉ/ගෙ ශේෂය | | | | | | |
| 860 | | 3/1 | මුදල් | | | | | | |

ගමන්

| | |
|---|---|
| 2/28 සුළු මුදල් 180 | |

සංග්‍රහ

| | |
|---|---|
| 2/28 සුළුමුදල් 220 | |

ලිපි ද්‍රව්‍ය

| | |
|---|---|
| 2/28 සුළු මුදල් 260 | |

වැටුප් අත්තිකාරම්

| | |
|---|---|
| 2/28 සුළුමුදල් 200 | |

07. i. අ. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රුː 15,000

බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු පිළිවෙලින්

රුː 3,000, රුː 1,200 (ල. 03)

ii.

| ගණුදෙනුව | වත්කම් | හිමිකම් | වගකීම් |
|---|---|---|---|
| 01 | +120,000 මුදල් | +120,000 ප්‍රාග්ධනය | - |
| 02 | මුදල් -7,500, ලී බඩු +7500 | - | - |
| 03 | මුදල් +50,000 | - | බැංකු ණය +50,000 |
| 04 | මුදල් -7,000 | - 7,000 | - |
| 05 | මුදල් -6,000 | -6,000 ගෙවල් කුලී | - |
| 06 | මුදල් -3,500 | -3,500 ගැනිලි | - |
| 07 | මුදල් -25,000 | - | බැංකු ණය -25,000 |

(ල. 09)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න